# ඇවිදින්න කකුලක්



දිනුගයා නිම්සාරා
විල්බාව

**කෘතියේ නම** ඇවිදින්න කකුලක්

**කතෘගේ නම** දිනුගයා නිම්සාරා විල්බාව

**කතෘයගේ අයිතිය ඇතුලත් විස්තර**

**කෘතිය පල කල දිනය**

2025-02-08

**978-624-208-438-1**

පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලිය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.
ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතිත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"භෙරණගත්කරණි"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.
මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දිමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

# පිදුම

මා වැනි සිසුවියකට
ඒ සතුටුදායික කතුවර
හැඟීම් ලැබීමට මට උදව් කරන්නා
වූ මාගේ ගුරුමෑණියන්ටත්,
ආදරණීය දෙමව්පියන්ටත්
ගෞරවයෙන් පුදමි.

මගේ නම පාවෙල්. මගේ එක
කකුලක් කොටයි. මට ඉස්කෝලේ
ළමයි කියන්නේ කකුල් කොටා
කියලා. මම ආසයි ෆූට් බෝල්
ගහන්න. අපේ ගෙදර ළග තියන
පිට්ටනියේ ළමයි ෆූට් බෝල්
ගහනවා.

මමටත් ආස හිතුනා.
මම ගෙදර ආවා. අම්මගෙන්
ෆුට් බෝලයක් ඉල්ලුවා අම්මා මොකුත
කිව්වේ නෑ




boys

මට ෆුට් බෝල් ගහන්න ආස හිතුනා. එත් මගේ කකුලක් කොට හින්දා මොකුත් කරන්න බෑ. ගෙදර හිටියත් එලියට ගියේ නෑ. මට බයයි. ජනේලය ළගට වෙලා බලා ගෙන හිටියා.

මම ඒක දිහා බලන් ඉද්දි මට ආස හිතුනා. මම යන්න ගියා. ආච්චි මට යන්න එපා කිව්වා.මට ෆුට් බෝලයක් ඕන වුණා. මගේ උපන් දිනය ආවා.

මම තෑග්ගක් ඉල්ලුවා
. ඒ ෆුට් බෝලයක් සහ කකුලක්. හැබැයි මට ලැබුනේ ෆුට් බෝලයක් විතරයි. මම ඒක තියාගත්තා කකුලක් ලැබුනම ගහන්න



මම කකුල වෙනුවට ඉනේ ඉදන් මගේ අනිත් කකුල වගේ යටට යනකන් ලිකැල්ලක් බැන්දා. එක පාරයි  කකුල තිබ්බේ ඒක කැඩුනා. මට ගොඩක් දුක හිතුනා.

මම එක කකුලෙන් ගෙදර ගියා. මම ළමයි සෙල්ලම් කරන විදිය බලාගෙන හිටියා.





ගෙදර ආවම අම්මා ඇහුවා අද කොහොමද ඉස්කෝලේ වැඩ කියලා. මම කිව්වේ වරදක් නෑ කියලා.

මම තාත්තත් එක්ක අපේ ගෙදර ළග තියෙන පිට්ටනියට ගියා. මට ආස හිතුනා.





ඒ වුනාට කවුරුත් මට කැමති නෑ. ඉස්කෝලේත් පටන් ගත්තා. මම ඉස්කෝලේ ගියා. මට ළමයි හිනාවෙන ගමන් කෑගැහුවා.

ඒ විතරක් නෙමෙයි ළමයි මට ගැහුවා. විවේක වෙලාව ආවා.

ළමයි පිට්ටනියට ගියා.





මගේ හොඳම යාළුවා තුලීන්
මාවත් පිට්ටනියට එක්ක ගියා.
ළමයි මාව එක්ක ආවා තරහට
එයාටත් යන්න කිව්වා..

මම කිව්වා ඔයා ඉන්න මම
යන්නම් කියලා තුලීන් මට යන්න
එපා කිව්වා. ළමයි මට ගැහුවා.
මම බිම ඇදගෙන වැටුනා.
මගේ අත් කකුල් හීරුණා.



විවේකය අවසන් වුණා. මම
පන්තියට ගියා. ගුරුතුමිය මගේ
සීරුම් පාරවල් දැක්කා. මගෙන් ඒ
ගැන ඇහුවා.  මම කිව්වේ මම අඹ
ගහෙන් වැටුනා කියලා. ළමයි මට
හිනා උනා. ඉස්කෝලේ අවසන්
වුණා . මාව ගන්න තාත්තා ආවා.




4-A

නත්තල් කාලෙත් ආවා. මම හිතුවේ මම ඉල්ලපු කකුල ලැබෙයි කියලා.

හැබැයි හම්බ වුණේ නෑ. මම නත්තල දවස නිසා ගොඩක් සතුටින් හිටියා.

නත්තල් දවසත් ඉවර වුණා. මම අපේ වට පිටාවේ තිබුන ප්ලාස්ටික් කෑලි එකතු කරා. මට කකුල් හදන්න. හැබැයි මම කොහොමද තනියම කකුලක් හදන්නේ.

ඊළඟ දවසත් පටන් ගත්තා. මම ඉස්කෝලේ ගියා.අද ඉස්කෝලේ ළමයි මට මුකුත් කලේ නෑ. මම පන්තිය ළගට යනකොට ළමයි මගේ ඇස් දෙක වැහුවා.

වහලා පන්තියට ගෙනිච්චා ගුරු මේසය උඩ ලොකු පෙට්ටයක් ගුරුතුම්ය මට ඒ පෙට්ටිය අරින්න කිව්වා.

ගුරුතුම්ය කිව්වා මේක ඔයාට කියලා. මට ගොඩක් සතුටුයි.

